# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සහ වෘත්තීය මාර්ගෝපදේශ සතිය.

රටක සංවර්ධනයේ පුරෝගාමී මහපෙන්වන්නා වනුයේ එරට නිපුණතා කුසලතා හා තාක්ෂණික ඥානයෙන් පරිපූර්ණ වූ නිවැරදි නිශ්චිත ඉලක්ක කරා ලඟා වෙන්නාවූ මානව සම්පතයි. ලෝකයේ සංවර්ධිත සියලු රටවල් එම තත්වය ලඟා කරගෙන ඇත්තේ සිය මානව සම්පත බලගැන්වීම මඟිනි. සොබා දහමේ අමිල සම්පතින් පෝෂණය වී ඇති ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනක් ලබා ගැනීමට නම් මෙරට මානව සම්පත නිවැරදිව බලගැන්වීම සිදු කල යුතුව ඇත. මෙකී කාර්යය වර්තමාන රජයේ තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එය අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2010 වර්ෂයේ ජනවාරි 01 දින සිට ස්ථාපිත කර ඇත්තේ, ජාතික මිනිස්බල සහ රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම, රැකියා නිර්මාණය සහ ප්‍රවර්ධන කටයුතු, වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු, ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස්කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම, රැකියා පියස මඟින් සිදු කෙරෙන සියලු සේවාවන් යන විෂයයන්ට අදාළ සියලු රාජකාරී සහ එම විෂයයන්ට අදාළව අනුශංගික හා සම්බන්ධිත සියලු කටයුතු ඉටු කිරීම වෙනුවෙනි.

ශ්‍රී ලංකාවේ මිනිස්බලය විධිමත්ව , නිවැරදිව සහ අඛණ්ඩව ගෝලීයව හා දේශීයව දිශානතිගත කිරීම සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විශ්වය ඥානනය කරන ඵලදායී මානවයෙක් බිහිකිරීමත්, සමස්තය යහපත්ව දකිමින් , යහපත් සංකල්ප ඇතිකර ගනිමින් , ඒ පිළිබඳ නිරන්තර සාකච්ඡා කරමින් , මනා සිහිබුද්ධියෙන් යුතුව , විනයගරුකව, ශික්ෂාකාමීව ,මානව ප්‍රේමීයව, යහපත් ජීවන පැවැත්මකින් යුතුව මනා වූ ආදරණීය සුන්දර උත්සාහයකින් , දේශීයව සහ ගෝලීයව සාර්ථක කර්මාන්තයක නියැලෙන නිව්ච්ච, හැදිච්ච, පිරිච්ච ශ්‍රම බලකායක් සහ සෞභාග්‍යයෙන් සපිරි ජන සමාජයක් ගොඩනැගීම අරමුණු කරගනිමින් වර්තමානයේ ක්‍රියාත්මක වේ.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල සෙත්සිරිපාය දෙවන අදියර 9 වන මහලෙහි ස්ථාපිතව ඇති අතර වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් ධූරය හොඹවනු ලබන්නේ අනූෂා ගෝකුළ ප්‍රනාන්දු මහත්මියයි. මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව දිවයිනේ සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි මහජන රැකියා සේවා මධ්‍යස්ථානය නමින් අංශයක් ක්‍රියාත්මක වේ. ඒ සෑම තැනකම මෙන්ම සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි මානව සම්පත් සංවර්ධන නිලධාරී ලෙස දෙපාර්තමේන්තු නිලධාරියෙකු සේවය සඳහා යොදවා ඇත.

මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශයන් 8ක් යටතේ ක්‍රියාත්මක වන අතර පොදු ජනතාව හා ඍජු ලෙසින් සම්බන්ධ වන, රැකියා නිර්මාණ ප්‍රවර්ධන , මහජන රැකියා හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය සහ ශ්‍රම වෙළඳපොළ තොරුතුරු හා පර්යේෂණ අංශයන් ඒ වෙනුවෙන් සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි.

රටක ශ්‍රම බලකාය ජාතික නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය එරට ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට හේතුවේ. ශ්‍රම බලකාය නිවැරදිව හා විධිමත්ව ජාතික නිෂ්පාදිතයට අනුගත නොවූ කල එය ආර්ථිකය මත ඇති කරනු ලබන පීඩනය අප වැනි රටක ආර්ථිකය දෙස බැලීමේ දී මනාව පිළිඹිබූ වේ. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ ඉහළ දායකත්වයත් ඔවුන් රාජ්‍ය වියදම් මත ඇතිකරනු ලබන විශාල බලපෑමට අනුරූපීව ඉන් ලැබෙන්නා වූ ප්‍රතිඵලය අවම වීමත්, රාජ්‍ය අංශය තුල පවතින්නාවූ රැකියා සුරක්ෂිතභාවය මත පමණක් රැකියා අපේක්ෂිතයින් ඒ පිළිබඳ විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් සිටීමත් පොදුවේ නිරීක්ෂණය වන්නකි. මෙයට මූලිකවම හේතු සාධක වී ඇත්තේ විරැකියාවෙන් පෙළෙන බහුතර පිරිස යම්කිසි අධ්‍යාපනයක් හෝ වෘත්තීය පුහුණු අවස්ථාවක් ලබා ගැනීමට නොපෙළඹීම, අවිධිමත් අංශයේ රැකියාවහි නියුක්තවීම හා ශ්‍රම වෙළඳපොළ සඳහා ප්‍රවේශවන පිරිසට ගැලපෙන පරිදි ජාතික ආර්ථිකය තුල සේවා නියුක්ති අවස්ථාවන් අවම වීම, රැකියා අවස්ථාවන් පැවතියද ඒවාට සරිලන පරිදි රැකියා අපේක්ෂිතයින්ගේ හැකියාවන් හා ලැදියාවන් නොගැලපීම වැනි සාධකයන්ය. මෙම රික්තකය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන්නේ වඩා නිවැරදි වෘත්තීය මාර්ගෝපදේශනයයි.

මානව සම්පත නිවැරදිව බල ගැන්වීමේ දී වෘත්තීය මාර්ගෝපදේශනයට නිරන්තරයෙන් හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන් ලබා දෙනු ලබන වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් සේවය කරනු ලබන එකම රාජ්‍ය ආයතනය වන්නේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවයි. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ වෘත්තීය මාර්ගෝපදේශ අංශය හා එයට අදාල අනෙකුත් කාර්යයන් ඉටු කරනු ලබන රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා මහජන රැකිය සේවා මධ්‍යස්ථානය සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි.

එසේම ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස්කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කර ඇති ශ්‍රම වෙළඳපොළ තොරතුරු හා පර්යේෂණ අංශය මඟින් ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තත්වයන් පිළිබඳව දත්ත එක්රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය තුළින් ශ්‍රම වෙළඳපොළේ නව්‍ය ප්‍රවණතාවන් සහ පුරෝකථනයන් ඉදිරිපත් කිරීම සහ ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම හා සැපයුමෙහි නම්‍යතාවයන් පිළිබඳ තොරතුරු ලබා දීමත් එම තොරතුරු අධ්‍යනය මඟින් ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය යෝජනා හා නිර්දේශයන් ඉදිරිපත් කිරීමත් සිදුකරනු ලබයි. ඒ අනුව මානව සම්පත සංවර්ධනය උදෙසා ශ්‍රම බලකාය

සවිබල ගන්වමින් සේවා වියුක්තිය අවම කිරීම මඟින් රටේ ආර්ථිකය  වර්ධනය ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සකසමින් දෙපාර්තමේන්තුව සක්‍රීය ප්‍රයත්නයක නියැලී සිටී.

වර්තමානයේ අප රටට ද මුහුණ දී ඇති  කෝවිඩ් 19 වසංගත තත්වය හමුවේ අත්‍යාවශ්‍ය  සේවාවන්හි නියැලෙන අනෙකුත් රාජ්‍ය ආයතන මෙන්ම මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ද  සියලු නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මාර්ගගත ක්‍රමය ඔස්සේ ප්‍රසංශනීය සේවාවක් තම සේවාලාභීන් වෙත ලබා දීමටත්, දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු මාර්ගත ඕක්‍රමවේදය අනුව යමින් සිදු කිරිමටත් සමත්විය. මේ සඳහා තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ගරු ලේකම් අනුරාධ විජේකෝන් මැතිතුමාගේ නොමද සහයෝගයද පැසසුම ද හිමිවිය.

මෙරට පොදු ජනතාව අතර නම කී සැනින් හඳුනාගනු ලබන රාජ්‍ය ආයතනයක් නොවූවද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ විෂය පථය හා එම නිලධාරීන් ඉටුකරනු ලබන නිහඩ සේවාව පිළිබඳව සත්‍ය තොරතුරු මහජනතාව අතරට ගෙනයාමත් , රටක මානව සම්පත එම රටට අතිශ්‍ය වැදගත් කණ්ඩායමක් බවට පත්වන්නේ කුමන ආකාරයනින්ද යන්න සහ මානව සම්පත බලගැන්වීම උදෙසා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳවත් පාසල් සිසුන්ගේ සිට සියලු ප්‍රජාවන් දැනුවත් කිරීම රටතුල පවතින මාධ්‍යන්ගේ ද ප්‍රමුඛ කාර්යයක් බව මෙහි දී පෙන්වා දීම අගනේය.

## වෘත්තීය මාර්ගෝපදේශ සතිය - CGW -2021 OCT 04th to 10th

වෘත්තීය මාර්ගෝපදේශනය දිගුකාලීන ක්‍රියාවලියක් නව අතර එය පුද්ගලයාගේ  මව්කුසේ සිටම මරණය දක්වාම විහිදෙන්නකි. ඒ අනුව පුද්ගලයාගේ ජීවිත කාලය පුරා ඉතා වැදගත් සංවර්ධනාත්මක ක්‍රියාවලියක් ලෙසින් වෘත්තීය මාර්ගෝපදේශනය හඳුන්වා දිය හැකිය. දරුවාගේ අධ්‍යාපනයේ මූලාරම්භයේ සිටම තමාගේ දක්ෂතාවයන් හා හැකියාවන් පවතින අංශය තෝරා ගැනීමටත්, එමඟින් සාර්ථක හා නිවැරදි තීරණ සඳහා යොමුවීමටත්, එමෙන්ම වෘත්තීය ජීවිතයට පිවිසීමෙන් පසු එහි විවිධ කඩයිම් සාර්ථක ලෙස පසු කිරිමටත්, සුවදායී විශ්‍රාම දිවියක් ලැබීමට හා එම කාලයේ ද සාර්ථකත්වය ලබා ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය මඟ පෙන්වනු ලබයි. වෘත්තීය මාර්ගෝපදේශනය පුද්ගලයා වෙත ප්‍රවේශ කිරීමේ එක් සංධිස්ථානයක් ලෙසින් දරුවාගේ පාසල් අවධිය හඳුනා ගෙන ඇති අතර රටතුල පවතින ආර්ථික, සමාජීය, සංවර්ධනාත්මක, දේශපාලනික ආදී සෑම ක්ෂේත්‍රයන් තුලම මෙම විෂයයේ අවශ්‍යතාවය දැඩිව ඉස්මතු වී ඇත. ඒ අනුව වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දෙනු ලබන රාජ්‍ය ආයතනයක් ලෙස

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව වගකීමෙන්, වගවීමෙන් හා කැපවීමෙන් එම කාර්යය සඳහා බැඳී සිටී.

වැඩ හැඩ හඩ ඇති දින 365 නොනිදන දෙපාර්තමේන්තුවක් ලෙස මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා එහි සේවාවන් ජනගත කිරීම උදෙසා ඉමහත් පරිශ්‍රමයකින් කටයුතු කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඇතුලු සියලු කාර්යය මණ්ඩලය එහි පළමු පියවර ලෙසින් මාර්ගගත ක්‍රමවේදය (Online) යටතේ CGW -2021 නමින් වෘත්තීය මාර්ගෝපදේශන සතියක් 2021 ඔක්තෝබර් 04 දින සිට ඔක්තෝබර් 10 වන දින දක්වා පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර ඇත.

ගෝලීය වශයෙන් තරගකාරී, නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුතු ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා ශ්‍රම බලකාය කුසලතා, නිපුණතා සහ තාක්ෂණික ඥානයෙන් බල ගැන්වීම, රැකියා නියුක්තිය ඉහළ දැමීම, සංවිධිත හා පරිපූර්ණ ශ්‍රම වෙළඳපොළ තොරතරු පද්ධතියක් ස්ථාපිත කිරීම, රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් මග ගැන්වීම හා රැකියාගත කිරීම සහ ගුණාත්මක හා සංවිධිත වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන් ලබා දීම හා ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් මෙම සතිය පුරා විවිධ වැඩසටහන් ක්‍රියාතමක කිරීමට නියමිතය.

මෙම සතිය තුළ දී පාසල් හා විශ්ව විද්‍යාල සිසුන්, රැකියා අපේක්ෂිතයින්, දෙමාපියන්,ගුරුවරුන්, තරුණ ප්‍රජාව, ස්වයං රැකියාලාභීන්, ව්‍යවසායකයින්, රැකියා සපයන්නන්, හා වෘත්තිකයින් වෙත වෘත්තීය මාර්ගෝපදේශනයේ පවතින වැදගත්කම පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අපේක්ෂිතය. මෙහිදී පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් (9,10,11 ශ්‍රේණිවල) පද්‍ය හා ගද්‍ය රචනා,චිත්‍ර, කථික තරග, ප්‍රශ්ණ විචාරාත්මක තරග ද වැඩිහිටියන් හා දරුවන් වෙන්වෙන් තම වෘත්තීය මං පෙත හෙළිකර ගැනීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශනයට අදාල විෂයානුබද්ධ පරීක්ෂණ මාර්ගගතව පැවැත්වීමට නියමිතය.

වෘත්තීය මාර්ගෝපදේශනය සතිය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dome.gov.lk හෝ අපගේ face book පිටුව වන http;//www.facebook.com/dome.gov.official හෝ you tube නාලිකාව වන Inspired Career පිවිසිමේ හැකියාව පවති. එසේත් නැතිනම් දුරකතන අංක 011 – 2187131 මඟින් හෝ විද්‍යුත් ලිපිනය dme.dirgen@hmail.com / dme.ad.cgd@gmail.com මගින් ප්‍රධාන කාර්යාලය අමතා හෝ ඔබ ප්‍රදේශයේ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරී / මානව සම්පත් සංවර්ධන නිලධාරී හමුවන්න.

“ එන්න එක් වන්න අප සමඟ. ඔබගේ වෘත්තීය සිහිනයට අපෙන් පියාපත් ලැබ නිදහසේ ඉගිලෙන්න සැරසෙන්න.”

නිලූෂිකා අතුකෝරළ

සංවර්ධන නිලධාරී

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව